## 12 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය 10වන සතිය - ජූලි 6 සිට ජූලි 10 දක්වා

## නිපුණතා මට්ටම 1.1 - ව්‍යාපාර සංඛ්‍යානය සහ එහි සීමා විමර්ශනය කරයි.

- සංඛ්‍යානය - විවිධ විෂයන් සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම,ඒවා සංවිධානය කිරීම,දත්ත ඉදිරිපත් කිරීම සහ ඒවා විශ්ලේෂණය හා අර්ථකථනය තුළින් නිගමනවලට එළඹීමේ ශිල්පීය ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීමයි.

- **සංඛ්‍යාන අධ්‍යයනයක පියවර**

1.අදාළ දත්ත රැස් කිරීම
2.සංවිධානය හා ඉදිරිපත් කිරීම
3.දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම
4.නිගමනවලට එළඹීම.

**සංඛ්‍යානයේ කාර්යභාරය**

1.කරුණු නිශ්චිත ආකාරයකට ඉදිරිපත් කිරීම.
2.සංකීර්ණ දත්ත තේරුම් ගැනීමට පහස වන ආකාරයට සරලව දැක්වීම.
3.සැසඳීමේ ශිල්ප ක්‍රමයක් වීම.
4.පුද්ගල අත්දැකීම් පුළුල් ව හා විද්‍යානුකූල ව විශ්ලේෂණය කළ හැකි වීම.
5.ප්‍රතිපත්ති සම්පාදනයට මග පෙන්වීම.
6.කිසියම් සංසිද්ධියක තරම ප්‍රමාණනය කළ හැකි වීම.
7.හේතු ඵල සම්බන්ධතා මතු කර දැක්වීමට උපකාරී වීම.

**අභ්‍යාස**

1.සංඛ්‍යානයේ සීමා 5ක් දක්වන්න.
2.සංඛ්‍යානයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.